විදේශ රැකියා අමාත්‍යංශය
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# ලියාපදිංචි වී විදේශ රැකියාවන්හි නිරත දෙමාපියන්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය - 2017

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියා සඳහා විදේශ ගතව සිටින දෙමාපියන්ගේ දූ දරුවන් වෙනුවෙන් 2017 වසරේදී ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය , ශිෂ්‍යාවන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

## සුදුසුකම්

### අ) <u>5 වසර ශිෂ්‍යත්ව</u>

1 මව හෝ පියා **2011.08.21** දින හෝ දිනට පසුව හා **2016.08.21** දින හෝ දිනට පෙර අතර කාලය තුල කාර්යාංශයේ **ලියාපදිංචිය ලබාගෙන තිබීම**

2 **2016** වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්වය දිස්ත්‍රික් කඩයිම් ලකුණු මට්ටම ලබා සමත් වීම.

### ආ) <u>අ.පො.ස.(සා/පෙ.) ශිෂ්‍යත්ව</u>

1. මව හෝ පියා **2010.12.08** දින හෝ දිනට පසුව හා **2015.12.08** දින හෝ දිනට පෙර අතර කාලය තුල කාර්යාංශයේ **ලියාපදිංචිය ලබාගෙන තිබීම**

2. **2015** වසරේ අ.පො.ස (සා/පෙ.) විභාගය **ගණිතය** ඇතුළුව විෂයන් **06** ක් සම්මාන සාමාර්ථ **03ක් සහිතව එකවර සමත් ව** උසස් පෙළ හදාරමින් සිටීම.

### ඇ) <u>උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව.</u>

1 මව හෝ පියා **2010.08.04** දින හෝ දිනට පසුව හා **2015.08.04** දින හෝ දිනට පෙර අතර කාලය තුල කාර්යාංශයේ **ලියාපදිංචිය ලබාගෙන තිබීම**

2 **2015** වසරේ අ. පො. ස. උසස් පෙළ සමත්වී **රජයේ විශ්ව විද්‍යාලයක පූර්ණ කාලීන අභ්‍යන්තර උපාධි පාඨමාලාවක** පළමු වසරේ අධ්‍යාපනය හදාරමින් සිටීම.

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විසින් මෙහි ප්‍රසිද්ධ කර ඇති අයදුම්පත සම්පූර්ණ කොට පහත සඳහන් ලියකියවිලිද සමග **ලියාපදිංචි <u>තැපැලෙන් 2017.04.30 දින හෝ දිනට පෙර</u>** පහත ලිපිනයට එවීමට කටයුතු කළ යුතුය. අයදුම්පත් එවන විට ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශිෂ්‍යත්ව ප්‍රදානය 5වසර/සා.පෙළ/උසස් අධ්‍යාපන - 2017"** යනුවෙන් සඳහන් කළ යුතුය. (මෙහි තමා ඉල්ලුම් කරන කාණ්ඩය පමණක් සඳහන් කළ යුතුය)

1. ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ උප්පැන්න සහතිකයේ පිටපත (විදුහල්පති හෝ ලේඛකාධිකාරී තිළ මුද්‍රාව තබා සත්‍ය පිටපතක් බවට සහතික කර තිබිය යුතුය)
2. ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ ප්‍රතිඵල ලේඛණයේ පිටපත (විදුහල්පති හෝ ලේඛකාධිකාරී තිළ මුද්‍රාව තබා සත්‍ය පිටපතක් බවට සහතික කර තිබිය.
3. මව/පියා ගේ විදේශ ගමන් බලපත්‍රවල ඡායාරූපය සහිත පිටුවේ පිටපත්.
4. ශිෂ්‍යත්ව අයදුම්කරුගේ හෝ විදේශ ගත අයගේ (මව/පියා) නම් වල යම් වෙනසක් ඇත්නම් ඒ පිළිබඳ සාමදාන විනිසුරුවෙකු මගින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශය.
5. ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ ජාතික හැඳුනුම්පතේ පිටපත (අ.පො.ස. (සා.පෙ.) හා උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අයදුම්කරුවන් සඳහා පමණි.)
6. විශ්ව විද්‍යාලයේ හදාරනු ලබන පාඨමාලාව පිළිබඳවත් , එහි කාලසීමාව සහ ප්‍රථම වසරේ අධ්‍යාපනය ලබන අයෙකු බවට ලේඛකාධිකාරීගේ අත්සන සහිතව ඔහු විසින් ලබා දෙන ලිපියේ මුල් පිටපත.

## ඉතා වැදගත්

- **අයදුම්පතෙහි 3 කොටස විදුහල්පති/පිරිවෙණාධිපති/ ආයතන ප්‍රධානී/ලේඛකාධිකාරී විසින් සම්පූර්ණ කර තිළ මුද්‍රාව තබා සහතික කළ යුතුය.**
- **එකම කාණ්ඩයේ ශිෂ්‍යත්වයක් සඳහා අයදුම්කළ හැක්කේ එක් වරක් පමණි.**
- **අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2017.04.30 වේ.**

**ඉහත කොන්දේසි සපුරා නොමැති හෝ නියමිත ලියකියවිලි සමග ඉදිරිපත් කරනු නොලබන හෝ අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර ඒවා කුමන හේතුවක් මත හෝ සළකා බලනු නොලැබේ.**

අයදුම්පත් යොමුව:- කළමණාකරු (සුභසාධන),
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය.
අංක. 234, සෙත්පති ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත.
කොස්වත්ත. බත්තරමුල්ල.

දුරකථන අංකය:- **011-2864117**

<u>**www.slbfe.lk**</u> යන කාර්යාංශ වෙබ් අඩවියෙන්ද තොරතුරු ලබා ගත හැක

සභාපති
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය